**ත්‍රිකුණාමලය නගර සභාව - 2022**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ත්‍රිකුණාමලය නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද 1.2(අ) (i), (ii) නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.1,114,489 ක හර ශේෂයක් විය. | සම්බන්ධිත ලේඛන සහ දත්ත අඛණ්ඩව පරික්ෂා කරමින් පවතින බැවින් ඒවා ලැබූ විටෙක සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |
| (ආ) | සංචාරක නිවාසවල ආරම්භක හිඟ බදුකුලී මුදලින් රු.367,770ක් සමාලෝචිත වර්ෂයේ ලැබීමේදී එය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි කාලයේදි ආදායම් ගිණුම් හා හිඟ ආදායම් ගිණුම් ආදිය වෙන් වෙන් ලෙජරයන්හි පවත්වා ගෙන යාමට පියවර ගන්නා බව. | එම වටිනාකම හිඟහිටි බදුකුලි වලින් අඩුකර දැක්විය යුතුය. |
| (ඇ) | 2019 සිට 2022 දක්වා වර්ෂ 04ක එකතුව රු.2,770,831 ක නොගෙවූ විගණන ගාස්තු සඳහා සහ සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ අවසාන ගිණුම්වල අදාල කරුණ නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම වන විගණන ගාස්තු යාවත්කාලීනව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ උසාවි දඩ ගාස්තු රු.288,660ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබුණි. | -එම- | ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් මාසයට අදාල ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.5,969,230 ක් ගිණුම්ගත කර නොතිබුණි. | උසාවි දඩ ගාස්තු සඳහා ලැයිස්තුගත කළ වටිනාකම ගණනය කිරීම ප්‍රායෝගිකව ගැටළු සහගත බැවින් ඉදිරියේදී ඇස්තමේන්තු කළ වටිනාකම ලැයිස්තු ගතකළ වටිනාකම ලෙස ගිණුම්වල හෙළිදරව් කිරීමට තීරණය කර ඇති බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.145,669 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතුවල අළුත්කිරීම්වල විස්තර ප්‍රකාරව නියමිත කාලපරිච්ඡේදයට අදාල පොළී ගණනය කර ගිණුම්වල හෙළිදරව් කරනු ලබන අතර අදාල කරුණ ප්‍රවර්තන වර්ෂයේ නිවැරදි කරන බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට ලැබිය යුතු වැටුප් සහ සභික දීමනා රු.10,784,193ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | ලැබිය යුතු ලෙස දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම්, ගෙවිය යුතු මුද්දර ගාස්තු සහ වරිපනම් බදු සඳහා ලබාදුන් වට්ටම් වැනි වියදම්වල එකතුව රු. 5,979,498ක් වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | අදාල වටිනාකම් ආදායම් හා වියදම් ගිණුමේ හෙළිදරව් කර ඇත. එසේම, සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් අතිරික්තය සමුච්චිත අරමුදලේ ගිණුම්ගත කිරීම වෙනුවට ආදායම් හා වියදම් වෙන් වෙන්ව ගිණුම්ගත කර ඇත. එසේ වුවත්, ඔබගේ උපදෙස් අනුව, සමුච්චිත අරමුදල ප්‍රවර්තන වර්ෂයේ හෙළිදරව් කිරීමට පියවර ගන්නා බව. | ගෙවිය යුතු වියදම් වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ හර කළයුතු අතර ජංගම බැරකම් යටතේ දැක්විය යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.17,952,501ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාල කරුණ නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,051,507 ක් වටිනා ගිණුම් ශේෂ 02 ක් නියමිත ලේඛන සහ ලෙජර් ගිණුම් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | විස්තර ඉල්ලා ඇති බව සහ විස්තර ලැබුණු විට නිවැරදි කරන බව. | විගණනයට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් 03 ක ශේෂ සහ ඒවාට අදාළ උපලේඛනවල එකතුන් අතර රු.3,701,147 ක වෙනසක් විය. | විචලනය සඳහා හේතු සොයා බැලීමට කටයුතු කරමින් පවතින බව. | ශේෂ සැසඳීම් සිදු කර නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | වර්ෂ 05 සිට වර්ෂ 20කට වැඩි කාලයක් මූල්‍ය | ඔබ විසින් අනාවරණය කර ඇති තැන්පතු ප්‍රමාණයට | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව, |

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.371 | ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පතුවල ඇතුළත් රු.92,249,690 ක තැන්පතු සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන්ට ගෙවීමට හෝ රජයට පැවරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අදාළ තැන්පතු ලේඛන 2013 වර්ෂයේ සිට මේ දක්වා යාවත්කාලීන කර ඇත. ඉන් සාක්ෂි සනාථන සහිත සහ හැකිව පවතින තැන්පතු සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමට මාරු කර ඇති අතර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගෙන ඇති බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX පරිච්ඡේදයේ 4.2, 4.4, 6.1, 6.3, 7, 7.2, 8 හා 9 වගන්ති | නගර සභාව විසින් රාජකාරි නිවාස කුලියට ලබාදීමේදී සහ නිලධාරිගේ කුලියට ගැනීමේ සුදුසුකම් තේරීමේදී තෝරා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 4.2 වගන්තිය ප්‍රකාරව, මාර්ගෝපදේශක් කඩිනමින් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව, සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 96,899,734ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 2,374,395ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. "000" | ඇස්තමේන්තුගත ආදායම රු. "000" | බිල්කළ ආදායම රු. "000" | රැස්කළ ආදායම රු. "000" | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු."000" |
| වරිපනම් හා බදු | 42,355 | 40,376 | 41,992 | 100,061 | 42,440 | 38,847 | 35,245 | 101,596 |
| කුලී | 36,570 | 28,925 | 20,727 | 45,623 | 37,774 | 27,865 | 25,536 | 38,161 |
| බලපත්‍ර ගාස්තු | 12,668 | 19,124 | 19,124 | -- | 13,399 | 13,660 | 13,660 | -- |
| වෙනත් ආදායම් | 14,330 | 11,038 | 6,038 | 33,212 | 16,469 | 8,912 | 8,912 | 3,711 |
| | **105,923** | **99,463** | **87,881** | **178,896** | **110,082** | **89,284** | **83,353** | **143,468** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | නගර සභාවේ බලප්‍රදේශය තුළ නිශ්චල දේපළ හිමිකරුවන් 3649 කට වරිපනම් බදු අය කිරීම පිළිබඳව 'K' ආකෘතිය මගින් දැනුම් දීම් කර නොතිබුණි. | ආකෘති පත්‍ර නිකුත් කිරීමේදී විශාල අපහසුතාවන්ට සභාව මුහුණුපා ඇති බව. | හිඟහිටි වරිපනම් බදු සම්බන්ධයෙන් දේපළ හිමිකරුවන්ට "K" ආකෘති පත්‍ර නිකුත් කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයට අදාළ රු.16,303,605 ක් සහ වර්ෂවලට අදාළ වරිපනම් බදු රු.101,596,687 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ බදු මුදල් අයකරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව හිඟ වරිපනම් බදු අය කළ යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නගර සභාවට අයත් ව්‍යාපාරික ස්ථාන 390කට අදාලව වර්ෂ 01 සිට 12ක් දක්වා කාලයක් හිඟහිටි කුලී එකතුව රු.46,194,443 ක් විය. | -එම- | ගිවිසුම් ප්‍රකාරව අය කර ගැනීම් සිදු කළ යුතුය. |
| (ඇ) | **මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.40,873,870 ක් විය. | මෙම කරුණ සම්බන්ධයෙන් ලිපි සහ ඍජුව ඉඩම් ලියාපදිංචි දෙපාර්තමේන්තුව සහ පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවලින් විමසා හිඟමුදල් ඉල්ලීම් කර තිබුණත් එම කාලයට අදාලව අප වෙත ලැබීමේ ප්‍රමාදයක් සිදුව තිබූ බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාවට අයත් හින්දු සුසාන භූමියේ ආදාහන කටයුතු සඳහා යොදා ගනු ලබන මේ දක්වා වටිනාකම හඳුනා නොගත් ගෑස් 06 (Gas cylinder) ක් සොරකම් කර තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය | ගෑස් සිලින්ඩර සොරකම් කිරීම සම්බන්ධයෙන් විමර්ශන පවත්වා වාර්තා ඉදිරිපත් කර ඇති විමර්ශනය සහ වාර්තාව යළි විමර්ශනය කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් විමර්ශන | විමර්ශන නිසි පරිදි පවත්වා වාර්තා අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ග ගෙන පරීක්ෂණ නිම කර නොතිබුණි. | කමිටුවක් පත් කර ඇති බව. | |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති ආයුර්වේද රෝහලෙහි 2022 සැප්තැම්බර් මාසයේ සිට ඖෂධ නොමැතිකම හේතුවෙන් රෝහලට පැමිණෙන රෝගීන්ට කිසිදු ඖෂධයක් ලබා නොදී ආපසු යවා තිබුණි. මේ සඳහා සලසා තිබූ ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදන කළමනාකාරීත්වය විසින් නිසි පරිදි උපයෝජනය කර නොතිබුණි. | ආයුර්වේද රෝහලේ 2022 සැප්තැම්බර් මාසයෙන් පසු වේදනා නාශක තෙල් අවසන් වී තිබුණි. එසේ වුවත්, අනෙකුත් ඖෂධ රෝගීන්ට ලබා දී ඇති බව. | අඛණ්ඩව සාමාන්‍ය ජනතාවට සේවා සැපයීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වර්ග කිලෝමීටර් 7.5ක් වර්ගඵලයකින් යුත් ත්‍රිකුණාමලය නගර සභා බලප්‍රදේශයේ රැස්කරන සියළුම කසල වෙන් නොකර කන්නියාහි පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියේ බැහැර කෙරෙමින් පැවතුණි. කසළ කළමනාකරණය සම්බන්ධයෙන් CGL ආයතනය සමග 2017 වර්ෂයේ අත්සන් කළ ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණි. | ඉදිරියේදී ගිවිසුම් ප්‍රකාරව නගර සභාව විසින් රැස්කරන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමට ලක්නොකර එලෙසම CGL International පුද්ගලික සමාගමට භාරදීමට හැකි වන බව. | ගිවිසුම් ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවට අයත් කඩකාමර 374 කින් කඩකාමර 80ක් 2019 වර්ෂයේ සිට කුලියට දීමට නගර සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාවට එකතුව රු.15,199,135ක ආදායමක් අහිමි වී තිබුණි. | කඩකාමර කුලියට දීමට කටයුතු කරමින් පවතින බව. | කඩකාමර කුලියට දීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | දේපළ තක්සේරු කිරීම් වර්ෂ 05 කට වරක් සිදු කළ යුතු නමුත් කඩකාමර තක්සේරු කිරීම් 2009 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි. | දේපළ ප්‍රත්‍යාගණනය සම්බන්ධව තක්සේරු දෙපාර්තමෙන්තුවේ සේවාව ලබාගැනීමට කිහිප අවස්ථාවක් ප්‍රයත්න දැරූ නමුත් එය අසාර්ථක වූ බව. | දේපළ ප්‍රත්‍යාගණනය කිරීම් වර්ෂ 05කට වරක් සිදු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පවරා නොගත් වත්කම්/හිමිකාරිත්වය මාරු නොකළ වත්කම්** | | |
| | වාහන 51ක් වර්ෂ 03 සිට 35ක් දක්වා නගර සභාව විසින් පරිහරණය කළ වාහන 51 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | එම වාහන කඩිනමින් හිමිකාරිත්වය මාරුකිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ නොහැකි තත්ත්වයක් පවතී. වර්තමානයේ ලියාපදිංචි පොත් ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | නගර සභාවේ නමට හිමිකාරිත්වය මාරු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | **නිෂ්කාර්ය/ඌන උපයෝජිත වත්කම්** | | |
| (i) | රෝහල් අපද්‍රව්‍ය පිළිස්සීමට සවිකළ රු.5,695,830ක් වටිනා යන්ත්‍රය 2018 වර්ෂයේ සිට මේ දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පවතින අතර යන්ත්‍රය මුළුමනින්ම මලකඩ බැඳී තිබුණි. | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයට එය භාරදීමට උත්සාහ දැරුවද වෙළඳපොලේ ඒ සඳහා අමතර කොටස් නොමැති බව පවසා එය භාරගෙන නොතිබුණු බව. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 1997 වර්ෂයේ ඉදිකළ කඩකාමර 54 ක් සහ මත්ස්‍ය වෙළෙඳපොල සහිත නගර සභාවට අයත් මලෙයියරුවි වෙළෙඳපොල සංකීර්ණය පසුගිය වර්ෂ 26ක් භාවිතා නොකර පැවැතුණි. | එම ස්ථානය ශ්‍රී සන්මුගා හින්දු කාන්තා විද්‍යාලයට ලබාදීම සම්බන්ධයෙන් සභාවේ තීරණය කර ඇති බව. | -එම- |
| (iii) | මධ්‍යම වෙළෙඳපොල සංකීර්ණයේ පිහිටි කඩකාමර 48ක් 2009 වර්ෂයේ සිට මේ දක්වා නිෂ්කාර්යව පැවැතුණි. | ගොඩනැගිලි ව්‍යුහයේ පවතින අඩුපාඩු හේතුවෙන් බදුකරුවන් විසින් බදු නොගන්නා ලදි. මෙම ස්ථානය ඵලදායි අයුරින් පරිහරණය කිරිම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් පරීක්ෂා කරමින් පවතින බව. | -එම- |
| (iv) | නගර සභාවට අයත් වාහන 43ක් වර්ෂ 12කට අධික කාලයක් පරිහරණය කළ නොහැකි තත්ත්වයේ පැවැති අතර එම වාහන ඉවත් කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම වාහන වෙන්දේසියේ විකිණීමට අදාල ලියාපදිංචි පොත් නොමැතිවීම හේතුවෙන් ඒවා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | එම වාහන ඉවත් කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| ප්‍රාථමික මට්ටමේ තනතුරු පුරප්පාඩු 88ක්, ද්විතියික පදනමේ නිලධාරී මට්ටමේ තනතුරු පුරප්පාඩු 29 ක්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 02 ක් ඇතුළුව සම්පූර්ණ පුරප්පාඩු 119 ක් පිරවීමට පියවර ගෙන නොතිබුණි. | 2022.04.26 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කළ නොහැකි බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ 74 කට ලබා දුන් රු.2,239,712 ක ණය අදාල සේවකයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අය කරගෙන නොතිබුණි. | මෙයින් විශාල ප්‍රමාණයක් දීර්ඝකාලයක සිට පැවැත එන ශේෂ වේ. ඔවුන් පිළිබඳ දත්ත කිසිවක් මේ දක්වා ලැබී නොමැත. මේවා ලැබූ විටෙක නිරවුල් කරන බව. | -එම- |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු කළ වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 14 සිට සියයට 394 ක් දක්වා විචලනයන් වූ බැවින් අය වැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය. | මිල ගණන් කිහිප ගුණයකින් වැඩිවීම, විදුලිය, ජල පාරිභෝජනය, විගණන ගාස්තු, නීතිඥ උපදෙස් ගාස්තු සහ සන්නිවේදන හිඟහිටි ගාස්තු සිදුකිරීම, ලබාදුන් වට්ටම් (වරිපනම් බදු), ලබාදුන් කොමිස් (මුද්දර ගාස්තු) ආදිය වැඩිවීම මෙයට හේතු වූ බව. | විශාල පරාසයක විචලනයන් වලක්වා ගැනිමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |